# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2023 අංක 26 දරන ජ්‍යොෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කිරීමේ පනත

---

**[සහතිකය සටහන් කළේ 2023 නොවැම්බර් මස 01 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2023 නොවැම්බර් මස 03 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 12.00 **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2023 අංක 26 දරන ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ
බහුමානය ප්‍රදානය කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 2023 නොවැම්බර් මස 01 වන දින]

එල්.ඩී.-ඕ. 13/2023

**නීතිඥ වෘත්තියෙහි විශිෂ්ටත්වය සහ උත්කෘෂ්ට තත්ත්වයන් ප්‍රදර්ශනය කොට ඇති උපදේශන නීතිඥවරයන් වශයෙන් වෘත්තියෙහි නිරත වන නීතිඥවරයන් විසින් සපයනු ලබන සේවාව පිළිගැනීමේ සහ අගය කිරීමේ අදහසින් යුක්තව, ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2023 අංක 26 දරන ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය

**2.** (1) අග්‍ර විනිශ්චයකාරවරයාගේ සහ අධිකරණ විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ නිරීක්ෂණ ලබා ගැනීමෙන් පසු, සහ 3 වන වගන්තිය යටතේ අධිකරණ විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින් සාදනු ලබන මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින් අතිගරු ජනාධිපතිතුමා විසින්- — ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කිරීම

(අ) ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කරනු ලබන දිනට වසර විස්සකට නොඅඩු කාලසීමාවක් උපදේශන නීතිඥවරයකු වශයෙන් සක්‍රියව නීතිඥ වෘත්තියෙහි නිරතව සිටින;

(ආ) නීතිඥ වෘත්තියෙහි විශිෂ්ටත්වයට පත්ව ඇති සහ පැවැත්මෙහි හා වෘත්තීය කටයුතු පිළිබඳ අවංකභාවයෙහි උත්කෘෂ්ට තත්ත්වයක් පවත්වාගෙන ඇති;

(ඇ) යම් ලිඛිත නීතියක් යටතේ යම් අපරාධමය වරදකට වරදකරු වී නොමැති;

(ඈ) 1988 ශ්‍රේෂ්ඨාධිකරණයේ (නීතිඥවරයන් සඳහා වූ වෘත්තීය පැවැත්ම සහ ආචාරධර්ම පිළිබඳ) රීති සහ 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත යටතේ යම් වෘත්තීය විෂමාචාරයකට වරදකරු වී නොමැති; සහ

(ඉ) මනා චරිතයකින් සහ කීර්තියකින් යුත් තැනැත්තකුව සිටින,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ යම් නීතිඥවරයකුට ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(2) යම් උපදේශන නීතිඥවරයකුට ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කිරීමේ දී, අතිගරු ජනාධිපතිතුමා විසින් එම උපදේශන නීතිඥවරයාට ඒ පිළිබඳ සහතිකයක් ලබාදිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ සහතිකයක් ලත් යම් නීතිඥවරයකු විසින් "ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ" යන පශ්චාත් නාමය භාවිත කළ හැකි ය.

අමාත්‍යවරයා විසින් මාර්ගෝපදේශ සෑදිය යුතු බව

**3.** (1) අධිකරණ විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින්, කලින් කලට, මේ පනතේ කාර්ය සඳහා ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සාදනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන මාර්ගෝපදේශ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කළ දිනයෙහි හෝ ඒ මාර්ගෝපදේශවල නිශ්චිතව දක්වා ඇති යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

අර්ථ නිරූපණය

**4.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ -

"උපදේශන නීතිඥවරයා" යන්නෙන්, එම නීතිඥවරයාගේ උපදෙස් මත අධිකරණයේ පෙනී සිටීම සඳහා යම් අධිනීතිඥවරයකුට උපදෙස් ලබා දීම ප්‍රධාන කාර්යය වූ නීතිඥවරයකු අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.